# මධ්‍යම පරිසර අධිකාරිය

## පරිසර අමාත්‍යාංශය

## CEA/AD/Proc/GEN/08/2023

# 2024 වසර සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

මධ්‍යම පරිසර අධිකාරිය, 2024 වසර සඳහා භාණ්ඩ, සේවා හා කාර්යයන් ලබාගැනීම සඳහා පිළිගත් සැපයුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවීමට තීරණය කර ඇත. ඒ අනුව අධිකාරියේ අවශ්‍යතාවය අනුව ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

භාණ්ඩ, සේවා හා කාර්යයන් සඳහා වූ එක් එක් අනු ප්‍රභේදයන් සඳහා ආපසු නොගෙවන රු. 1,000/= ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය. මෙම ගාස්තුව ම. ප. අ. සරප් නිලධාරි වෙත හෝ ලංකා බැංකුවේ පැලවත්ත ශාඛාවේ අංක 0002937303 දරන ගිණුමෙහි තැන්පත් කිරීම මගින් ගෙවිය හැකිය. මුදල් තැන්පත් ලදුපතෙහි මුල් පිටපත ඔබේ අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

අනු ප්‍රභේද අයදුම්පත්, අදාළ ආකෘතිපත් හා මාර්ගෝපදේශ ම. ප. අ. වෙබ් අඩවියේ (www.cea.lk) **"ප්‍රසම්පාදන දැන්වීම් - සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2024"** යටතේ 2023.11.28 දින සිට 2023.12.28 දින දක්වා බාගත කරගත හැකිය.

සම්පූර්ණ කළ අයදුම්පත් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය, VAT ලියාපදිංචි සහතිකය, CIDA ලියාපදිංචි සහතිකය (අදාළ වේ නම්) සහ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහතිකය (අදාළ වේ නම්) යන සහතිකවල පිටපත් සමග 2023.12.28 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2024"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඕනෑම අයදුම්පතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සතුවේ.

**අධ්‍යක්ෂ (පරිපාලන),**
**මධ්‍යම පරිසර අධිකාරිය, "පරිසර පියස",**
**නො. 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**
**දුරකථන අංක : 0112872278, 011-2124623**
**2023 නොවැම්බර් 28**